# ඉන්දීය සහ ලාංකේය සංස්කෘතික සංකේත මගින් පිළිබිඹු වන විවිධ අරමුණු සහ විශ්වාස පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

*ජයසේකර, මහේෂිකා තමරි* [1]

මිනිසා සතු අද්විතීය සමාජ උරුමයක් වන සංස්කෘතිය මගින් පුද්ගලයාගේ අනන්‍යතාව මෙන්ම රටක, ජාතියක අනන්‍යතාවය ලොවට විදහා දක්වයි. මානව විද්‍යාත්මක අර්ථයෙන් බලන කල සංස්කෘතිය යනු යම්කිසි නිශ්චිත ප්‍රදේශයක වෙසෙන යම්කිසි පිරිසක් විසින් පරම්පරාවෙන් පරම්පරාවට උරුම කරන ලද ඔවුන්ට ආවේණික වූ ඇදහිලි හා විශ්වාස, සිරිත්-විරිත්, පුද-පූජා, ආගම්, සාරධර්ම, අත්දැකීම්, දැනුම සහ භාෂා යන අංගයන්ගෙන් සැදුම්ලත් ඒකකයක් ලෙස හැඳින්විය හැක. සංස්කෘතිය භෞතික සහ අභෞතික ලෙස කොටස් දෙකකි. භෞතික සංස්කෘතියට ඇඳුම්-පැලඳුම්, ගොඩනැගිලි, උපකරණ ආදි මිනිසා විසින් නිර්මාණය කරගන්නා ලද සියලු භෞතික වස්තූන් අයත්ය. සංස්කෘතියෙහි පවතින භාෂා, ඇදහිලි හා විශ්වාස, සිරිත්විරිත්, ආකල්ප ආදි භෞතිකව ග්‍රහණය කර ගත නොහැකි සියලු දෑ අභෞතික සංස්කෘතියට අයත් වේ. ඉන්දියානු සහ ලාංකේය සංස්කෘතීන් දෙස බලන කල ඉන්දියානු සංස්කෘතියෙහි භාවිත වන ඇතැම් සංස්කෘතික සංකේත ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහිද දක්නට ලැබීම ඉතා සුවිශේෂී කරුණකි. රටක සංස්කෘතිය ලොවට විදහා දක්වන මෙම සංස්කෘතික සංකේත අධ්‍යනය කිරීම මගින් ඒ හා බැඳි ඉතිහාසය, ආගම්, විශ්වාස ආදිය අවබෝධ කරගත හැක. ඉන්දියානු ජන සමාජයේ මෙන්ම ලාංකේය ජන සමාජයෙහිද ආගමික විශ්වාස හා ඇදහිලි රැසක් මෙම සංස්කෘතික සංකේත සමඟ බැඳී පවතී. එම ජන සමාජයන්හි, සංස්කෘතික සංකේත සඳහා මෙතරම් විශ්වාසයක් හා වටිනාකමක් ලැබීමට හේතු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. ඒ ඇසුරෙන් ඉන්දියානු සහ ලාංකේය සංස්කෘතීන්හි එකම සංස්කෘතික සංකේතය කුමන අරමුණු සහ විශ්වාස මුල් කොට ගෙන භාවිත වනවාද යන්න පිළිබඳ තුලනාත්මක අනාවරණයක් ඉදිරිපත් කිරීම, මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිතයි.

ප්‍රමුඛ පද: ඇදහිලි හා විශ්වාස, ලාංකේය සමාජය, ඉන්දියානු සමාජය, සංස්කෘතිය, සංස්කෘතික සංකේත

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*thamarijayasekara8@gmail.com*